# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.10 පැය 1615 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 701 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**01. ව්‍යාජ ලේඛණ සකස් කළ ස්ථානයක් වටලා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.04.08 වන දින බොරලැස්ගමුව පොලිස් වසමේදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් නීති විරෝධී ලෙස පවත්වාගෙන යනු ලැබූ සම්බාහන මධ්‍යස්ථානයක වැටලීමක් සිදු කර ඇත. එම වැටලීමේදී අත්අඩංගුවට ගන්නා ලද කාන්තාවක් සන්තකයේ තිබී ව්‍යාජ හැඳුනුම්පතක් හමුවී ඇති අතර ඒ සම්බන්ධව සිදු කරන ලද වැඩිදුර විමශර්නයේදී ව්‍යාජ හැඳුනුම්පත් සකස් කරනු ලබන පුද්ගලයෙකු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගෙන ඇත.

ඒ අනුව සිදු කරන ලද විමශර්නයේදී 2025.04.09 වන දින ව්‍යාජ ලේඛණ සකස් කිරීමට ආධාර අනුබල ලබා දීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. එම සැකකරුගෙන් ලද තොරතුරු මත වැලිකඩ පොලිස් වසමේ ඔබේසේකරපුර, රාජගිරිය ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලැබූ ව්‍යාජ ලේඛන සකස් කිරීමේ ස්ථානයක් වටලා එම ස්ථානය පවත්වාගෙන යනු ලබන සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 49 හා 57 අතර වයස් වල පසුවන පොල්ගස්ඕවිට හා රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම සැකකරු විසින් විවිධ ආයතන නමින් සහතික පත්‍ර, ව්‍යාජ ටෙන්ඩර් බලපත්‍ර, ව්‍යාජ ආදායම් බලපත්‍ර, ව්‍යාජ ජාතික හැඳුනුම්පත්, ව්‍යාජ වාහන බලපත්‍ර, ව්‍යාජ විදේශ ගමන් බලපත්‍ර, ව්‍යාජ රියදුරු බලපත්‍ර සකස් කර ඇති බවට අනාවරණය වී ඇති අතර එම ව්‍යාජ ලේඛණ සකස් කිරීමට උපයෝගී කර ගන්නා ලද ලැප්ටොප් පරිඝණක යන්ත්‍රයක්, කලර් ප්‍රින්ටරයක්, ලැමිනේට් යන්ත්‍රයක් ඇතුළු දේපල අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් 2025.04.10 වන අද දින නුගේගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2025.04.21 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

වැටලීමට අදාළ ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**02. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.04.10 වන දින අළුයම් කාලයේ කෙසෙල්වත්ත පොලිස් වසමේ කොළඹ 12 ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන කෙසෙල්වත්ත පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 55 වන අක්බාර් පටුමග, කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගොතටුව පොලිස් ස්ථානය.**

2025.04.10 වන දින උදෑසන කාලයේ ගොතටුව පොලිස් වසමේ මාදින්නාගොඩ ප්‍රදේශයේදී ගොතටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන මාදින්නාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගොතටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**